# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2150/8 – 2019 නොවැම්බර් 19 වැනි අඟහරුවාදා – 2019.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2082/61 හා 2018.08.03 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2018 අංක 172 හා 2018.08.02 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද මෙහි පහත විස්තර වන ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 2082/61 හා 2018.08.03 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2018 අංක 172 හා 2018.08.02 වැනි දින දරන ආඥාවට අයත් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2018/HW/65.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: මීරි/ප්‍රා.ලේ./ඉ/3/2018.
2019 නොවැම්බර් මස 08 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 338, ගල්ගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගල්ගමුව ගමේ පිහිටි, ගම්පහ දිස්ත්‍රික්කය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක ජීජ්/එම්ජීර්/2018/193 හා 2018.06.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' සිට 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.9149ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කීනවල එස්ටේට් – ප්‍රමාණය: හෙක්. 0.6125**
උතුරට: මාර්ග (ප්‍රා.ස.); නැගෙනහිරට: කේ. කේ. හෙට්ටිආරච්චි හිමිකම් කියන මීගහවත්ත, හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම, එම්. එල්. කරුණාසිරි පෙරේරා හිමිකම් කියන මීගහවත්ත සහ එම්. ඒ. ප්‍රදීප් බණ්ඩාර හිමිකම් කියන මීගහවත්ත; දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: මාර්ග (මා.සං.අ.).

02. **කැබලි අක්ෂර 'බී' – කීනවල එස්ටේට් – ප්‍රමාණය: හෙක්. 0.3024**
උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: එම්. ඒ. ප්‍රදීප් බණ්ඩාර හිමිකම් කියන මීගහවත්ත, එච්. එම්. ඩී. සරත් ධර්මසිරි ජයවර්ධන හිමිකම් කියන මීගහවත්ත සහ එච්. එම්. කේ. නාලක ක්‍රිෂාන්ත ගුණවර්ධන හිමිකම් කියන මීගහවත්ත; දකුණට: පූජ්‍ය පඤ්ඤාලෝක හිමි හිමිකම් කියන දාන්වියාවත්ත; බටහිරට: මාර්ග (මා.සං.අ.).

12 - 27